

# 2

# අල් අස්මාඋල් හුස්නා

අල්ලාහ් පිළිබඳ විශ්වාසය ඊමානයේ ප්‍රමුඛස්ථානය වේ. අල්ලාහ් විශ්වාස කිරීමට ඔහු පිළිබඳව දැන ගෙන සිටිය යුතු ය. අල්ලාහ් පිළිබඳව නිවැරදිව වටහා ගැනීමට ඔහුගේ ශුද්ධ නාමයන් ද (අස්මාඋල් හුස්නා) ඔහුගේ ගුණාංග ද (සිෆාත්) සහය වේ.

අල්ලාහ්ට අලංකාර නාමයන් ඇත යන්න, අල්කුර්ආන් පහත දැක්වෙන පරිදි සඳහන් කර ඇත.

**අල්ලාහ් හැර අන් දෙවියකු නැත. ඉතා අලංකාර නාමයන් හිමි වන්නේ ඔහුට ම ය.** (20 : 08)

**නබි තුමාණනි, ඔබ පවසන්න, නුඹලා අල්ලාහ් යනුවෙන් (ඔහු) කැඳවනු. නැතහොත්, අර් රහ්මාන් යනුවෙන් කැඳවනු. නුඹලා කෙසේ කැඳවුව ද ඔහුට තවත් ඉතා අලංකාර නම් රැසක් ඇත.** (17 : 110)

**අල්ලාහ් මැවුම්කරු ය; (ඔහු ම ය) මැවීම්වල උත්පාදකයා ය. (ඔහු ම ය) මැවීම්වල රූපයේ මූර්තිකරුවා ය. ඔහුට අලංකාර නාමයන් තිබේ. අහසේ හා මහපොළොවෙහි ඇ ඔහු සුවිශුද්ධ කරයි. ඔහු සර්ව බලධාරියා ය; සර්ව ප්‍රඥාවන්තයා ය.** (59 : 24)

අල්ලාහ්ට හිමි අස්මාඋල් හුස්නාහි සංඛ්‍යාව පිළිබඳව පහත දැක්වෙන පරිදි හදීස්වල සඳහන් කර ඇත.

"අල්ලාහ්ට අලංකාර නාමයන් 99ක් ඇත. යමෙකු ඒවා කටපාඩම් කරන්නේ ද ඔහු ස්වර්ගයට ඇතුළු වේ." (බුහාරි)

අස්මාඋල් හුස්නා කටපාඩම් කිරීම පමණක් නොව එය නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා ඉගැන්වූ පරිදි එදිනෙදා ජීවිතයේ දී පිළිපැදිය යුතු ය. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා තම දෛනික ජීවිතයේ ප්‍රාර්ථනාවල හා දික්ර්වල අල්ලාහ්ගේ ශුද්ධ නාමය අධික වශයෙන් එක් කර ගත්තේ ය.

"යා අල්ලාහ් ! නුඹගේ ශුද්ධ වූ නාමයෙන් මම නිදගන්නෙමි නුඹගේ ශුද්ධවූ නාමයෙන් ප්‍රාණයට පත් වන්නෙමි," (මුස්ලිම්) යැයි නින්දට යෑමට පෙර ප්‍රාර්ථනා කළහ.

අස්මාඋල් හුස්නා 99 ම තිර්මිදි නම් හදීස් ග්‍රන්ථයේ සටහන් කර ඇත.


بسم الله الرحمن الرحيم
هو الله الذي لا إله إلا هو
الرحمن
الرحيم
الملك
القدوس
السلام
المؤمن
المهيمن
العزيز
الجبار
المتكبر
الخالق
البارئ
المصور
الغفار
القهار
الوهاب
الرزاق
الفتاح
العليم
القابض
الباسط
الخافض
الرافع
المعز
المذل
السميع
البصير
الحكم
العدل
اللطيف
الخبير
الحليم
العظيم
الغفور
الشكور
العلي
الكبير
الحفيظ
المقيت
الحسيب
الجليل
الكريم
الرقيب
المجيب
الواسع


الحكيم
الودود
المجيد
الباعث
الشهيد
الحق
الوكيل
القوى
المتين
الولى
الحميد
المحصى
المبدئ
المعيد
المحيى
المميت
الحى
القيوم
الواجد
الماجد
الواحد
الاحد
الصمد
القادر
المقتدر
المقدم
المؤخر
الاول
الآخر
الظاهر
الباطن
الوالى
المتعال
البر
التواب
المنتقم
العفو
الرؤف
مالك الملك
ذو الجلال والإكرام
المقسط
الجامع
الغنى
المغنى
المانع
الضار
النافع
النور
الهادى
البديع
الباقى
الوارث
الرشيد
الصبور

මෙම ගුණ නාමයන් අනූ නවය අල්ලාහ් යන සුවිශේෂ වූ ගුණ නාමයේ ලක්ෂණ ලෙස පවසා ඇත. එබැවින් **අල්ලාහ්** යන ශුද්ධ නාමය **"ලෆ්ලුල් ජලාලාහ්"** යනුවෙන් අමතනු ලැබේ.

අස්මාඋල් හුස්නා මගින් අල්ලාහ්ගේ දැනුම, හැකියාව, බලය, උසස් ගුණාංග හා ශක්තිය යනාදී සියල්ලෙහි ම ඔහු අසමානයෙකි; යන්න පැහැදිලි ය. කිසිවෙකු ඔහුට සමාන කළ නොහැකි ය, යන්න මුඃමින්වරයකුගේ සිතෙහි ගැඹුරින් සටහන් විය යුතු ය. එසේ ම අල්ලාහ්ගේ මැවීම් ඔහුගේ ගුණාංගවලට සමාන කළහොත් එය ෂිර්ක් බවට පත් වේ.

අකීද ක්ෂේත්‍රයේ විද්වත්හු අස්මාඋල් හුස්නාව එහි අර්ථය පදනම් කර පහත සඳහන් පරිදි වර්ග කළහ. ඒ අතරින් කිහිපයක් මෙසේ ය.

1. අල්ලාහ්ගේ මැවීමේ ශක්තිය සමග සම්බන්ධ ඒවා
2. අල්ලාහ්ගේ සෙනෙහස සමග සම්බන්ධ ඒවා
3. අල්ලාහ්ගේ බලය, ශක්තිය සමග සම්බන්ධ ඒවා
4. අල්ලාහ්ගේ දැනුම සමග සම්බන්ධ ඒවා

**අල්ලාහ්ට ඉතා අලංකාර නාමයන් තිබේ. එබැවින් ඔහුට එම අලංකාර නම්වලින් ආමන්ත්‍රණය කරනු. ඔහුගේ නාමයන්හි දෝෂාරෝපණය කරන්නන් නොසලකා හරිනු. ඔවුන් කරමින් සිටි දෑයෙහි ඵලවිපාකය ඔවුනට ලැබෙනු ඇත.** (7: 180)

අල්ලාහ්ගේ අලංකාර ශුද්ධ නාමයන් අවධානයට ලක් කරමු.

අස්මාඋල් හුස්නාවෙහි අන්තර්ගත අල්ලාහ්ගේ ගුණාංග සමග සසඳන කල්හි ඔහු විසින් මවන ලද මිනිසා ඉතා ම දුර්වලවූවෙකු, යන්න වටහා ගත හැකි ය. එහෙයින් මිනිසා තම ජීවිතයේ දී ශෝකය ඇති වූ විට තමන්ව මැවූ බල සම්පන්න අල්ලාහ් සොයා යා යුතු ය; ඔහුගෙන් ම උපකාර ද, ආරක්ෂාව ද සෙවිය යුතු ය. මෙවැනි අවස්ථාවල දී මුඃමින්වරු තම දුආවන්හි අස්මාඋල් හුස්නා භාවිත කිරීම ඉතා ම යහපත් ය.

අස්මාඋල් හුස්නා මගින් අල්ලාහ්ගේ ශ්‍රේෂ්ඨත්වය දැනගෙන ඊමානය සම්පූර්ණ කර ගත හැකි ය. තව ද, එය මනනය කර අර්ථය වටහා ගෙන, දිනපතා පාරායනය කිරීම මගින් අල්ලාහ් වෙත සමීප වීමට ප්‍රයත්න දැරිය යුතු ය.

**අභ්‍යාස**

**(අ) හරි වැරදි ලකුණු කරන්න.**

1. අස්මාඋල් හුස්නා යන්නෙන් අල්ලාහ්ගේ ක්‍රියාකාරකම් යන්න අර්ථ
   ැන්වේ.                ග ( )
2. අල්ලාහ්ට අස්මාඋල් හුස්නා 99ක් ඇත. ( )
3. 'අල්ලාහ්' යන නාමය සුවිශේෂ ය. ( )
4. මිනිසාට තම අභිප්‍රාය මත වැරදි නාමයකින් අල්ලාහ් ඇමතිය හැකි ය. ( )
5. 'අර්රහ්මාන්' යන්න අල්ලාහ්ගේ දයාව හා සබැඳි ගුණාංගය පෙන්නුම් කරයි. ( )

**(ආ) කෙටි පිළිතුරු සපයන්න.**

1. අස්මාඋල් හුස්නා මගින් අල්ලාහ් ආමන්ත්‍රණය කළ යුතු ය, යන්න පහදන අල්කුර්ආන් වැකියක් ලියන්න.
2. ''ලෆ්ලුල් ජලාලාහ්'' යැයි අමතන ශුද්ධ නාමය කුමක් ද?
3. අස්මාඋල් හුස්නා 99 ම සඳ හන් ව න හදීසය සටහන් ක ර ඇත්තේ කු,මන ග්‍රන්ථයේ ද?
4. අස්මාඋල් හුස්නා 10ක් අරාබියෙන් ලියා එහි අර්ථය සිංහලෙන් ලියා පෙන්වන්න.
5. සූරා අල් ෆාතිහා හි අන්තර්ගත සෙනෙහස හා සබැඳි අල්ලාහ්ගේ අස්මාඋල් හුස්නා දෙකක් ලියන්න.